ශීර්ෂය 160- පරිසර අමාත්‍යාංශය - 2024

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

ශීර්ෂය 160 - පරිසර අමාත්‍යාංශයේ 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2024 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2025 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2025 මැයි 27 දින ප්‍රධාන ගණන්දීමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2024 දෙසැම්බර් 31 දිනට පරිසර අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව	ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය	මෙම වාර්තාවේ ඡේද යොමුව
1.6.1. (අ) (ii)	පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඉඩමේ තක්සේරු අගය වූ රු.261,000,000 ක් මූල්‍ය ප්‍රකාශන වල හෙළිදරව් කිරීමට කටයුතු කළ යුතුය.	1.6.1. (අ) (i)
1.6.1. (ආ)	අමාත්‍යාංශයේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළ 2023 නොවැම්බර් 09 දින අපහරණය කර තිබූ වාහනයක් සහ 2023 දෙසැම්බර් 31 දින වන විට වෙනත් ආයතන වෙත පවරා දී තිබුණු වාහන 10 කට අදාල රු. 27,790,000 ක වටිනාකමද ඇතුළත්ව තිබුණි.	1.6.1. (අ) (ii) (iii)

1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

(අ) දේපල පිරියත හා උපකරණ

දේපල පිරියත හා උපකරණ ගිණුම්ගත කිරීම සම්බන්ධයෙන් පහත සඳහන් අඩුපාඩු අනාවරණය විය.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(i)	පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන සොබාදම් පියස ගොඩනැගිල්ල පිහිටි ඉඩමේ තක්සේරු වටිනාකම වූ රු 261,000,000.ක් මූල්‍ය නොවන වත්කම් යටතේ මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණය කිරීමට හා ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට කටයුතු කර නොතිබුණි.	ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමෙන් පසු ඉඩමේ තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුළ අනාවරණයකිරීමට කටයුතු කරනු ලැබේ.	පරිසර අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල පිහිටි ඉඩම නීත්‍යානුකූලව පවරා ගැනීමට හා ඉඩමේ හා ගොඩනැගිල්ලේ තක්සේරු වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල අනාවරණය කිරීමට කටයුතු කිරීම.

(ii)	අමාත්‍යාංශය විසින් භාවිතයෙන් ඉවත් කරන ලද ජීප් රථයක වටිනාකම වූ රු.3,000,000 ක් 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත්ව තිබුණි.	නීත්‍යානුකූලව පවරා දුන් පසු මූල්‍ය නොවන වත්කම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	අපහරණය කල වත්කම් අගය ගිණුම් වලින් ඉවත් කල යුතුය.
(iii)	උමාඔය පහළ නිම්න සංවර්ධන ව්‍යාපෘතියට තාවකාලිකව අනුයුක්ත කර තිබූ වාහන 09 ක් පරිසර අමාත්‍යාංශය විසින් 2022 අප්‍රේල් 26 දින වාරිමාර්ග අමාත්‍යාංශය වෙත නීත්‍යානුකූලව පවරාදීමට අදාළ මූලික කටයුතු කර තිබුණ ද වර්තමානයේදී අමාත්‍යාංශය භාවිතා නොකරන උක්ත වාහන 09 ට අදාල රු.16,800,000 ක වටිනාකම ද 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළ ඇතුළත්ව තිබුණු බව නිරීක්ෂණය විය.	මේ වන තෙක් නීත්‍යානුකූලව පවරා දී නොමැති අතර නීත්‍යානුකූලව පවරා ගත් පසු මූල්‍ය නොවන වත්කම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	පවරා දීමේ කටයුතු කඩිනම් කර ගිණුම් පොත්පත් නිවැරදි කර ගැනීමට කටයුතු කළ යුතුය .
(iv)	වනජීවී හා වන සංරක්ෂණ අමාත්‍යාංශය වෙත 2020 සැප්තැම්බර් 21 දින භාරදී තිබූ කැබ් රථයේ වටිනාකම රු.7,990,000 ක් 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ මූල්‍ය නොවන වත්කම් තුළ ඇතුළත් කර තිබුණි.	නීත්‍යානුකූලව පවරා ගත් පසු මූල්‍ය නොවන වත්කම් තුළින් ඉවත් කිරීමට කටයුතු කරනු ලැබේ.	නීත්‍යානුකූලව පැවරීමේ කටයුතු කඩිනම් කර වත්කම් නිසි පරිදි ගිණුම්ගත කල යුතුය.
(v)	වාරිමාර්ග හා ජල සම්පත් කළමනාකරණ අමාත්‍යාංශය නමින් පවතින වාහන 2ක් වර්තමානයේදී පරිසර අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලැබුවද එම වාහන වල අයිතිය පරිසර අමාත්‍යාංශය නමට පවරාගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඊට අදාල රු.9,900,000 ක වටිනාකම 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළ ඇතුළත් කිරීමටද කටයුතු කර නොතිබුණි.	මෝටර් රථය පවරා ගැනීම සඳහා එකඟතාවය ලබා ගැනීමට රාජ්‍ය ආරක්ෂක අමාත්‍යාංශය වෙත ලිපියක් ඉදිරිපත් කර ඇත. ජීප් රථයේ ලියාපදිංචි අයිතිය පවරා දීම සඳහා එම්.ටී.ඒ.06 ආකෘතිය සම්පූර්ණ කර ඉදිරිපත් කරන ලෙස කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය මගින් කල දැනුම්දීම අනුව එම ආකෘතිය සම්පූර්ණ කර කොම්ප්ට්‍රොලර් ජනරාල් කාර්යාලය වෙත යොමු කර ඇත.	නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර වත්කම් නියමිත පරිදි ගිණුම්ගත කල යුතුය.

(vi)	වර්තමානයේදී පරිසර අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වටිනාකම රු.2,500,000 ක් වූ වාහනය 2024 දෙසැම්බර් 31 දිනට මූල්‍ය නොවන වත්කම් අගය තුළ ඇතුළත් කර නොතිබුණු බව නිරීක්ෂණය විය.	නීත්‍යානුකූලව පවරා ගත් පසු මූල්‍ය නොවන වත්කම් තුළට ඇතුළත් කර ගැනීමට කටයුතු කරනු ලැබේ.	නීත්‍යානුකූලව පවරා ගැනීමේ කටයුතු කඩිනම් කර වත්කම් නියමිත පරිදි ගිණුම්ගත කල යුතුය.

2. මූල්‍ය සමාලෝචනය

2.1 වියදම් කළමනාකරණය

	විගණන නිරීක්ෂණය	**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
(අ)	2024 වර්ෂය සඳහා වැය විෂයන් 08 ක් වෙනුවෙන් ලද රු.10,700,000 ක ප්‍රතිපාදනය මුළුමනින්ම ඉතිරි වී තිබුණි.	අමාත්‍ය කාර්ය මණ්ඩලය විසින් ඉල්ලීම් සිදු නොකිරීම, අමාත්‍ය කාර්ය මණ්ඩලයක් නොමැති අවස්ථා පැවතීම , පළාත් පාලන ආයතන විසින් බදු කුලී සඳහා ගාස්තු ඉල්ලීම් නොකිරීම, සැලසුම් කල ලෙස පුහුණු වැඩසටහන් සම්පූර්ණ කරගත නොහැකි වීම, අපේක්ෂා කල පරිදි මූලධන වත්කම් පුනරුත්ථාපනය හා අලුත්වැඩියා කිරීමට අවශ්‍ය නොවීම ඉතිරියට හේතුන් විය.	අවශ්‍යතාවයට ගැලපෙන ප්‍රමාණයට පමණක් ප්‍රතිපාදන වෙන් කරවා ගත යුතුය.

2.2 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති, රීති හා රෙගුලාසිවල විධිවිධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

	නිරීක්ෂණය			**ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම**	**නිර්දේශය**
	නීති,රීති හා රෙගුලාසි වලට යොමුව	**වටිනාකම රු.**	**අනුකූල නොවීම**		
	ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය				
(i)	මුදල් රෙගුලාසි 104(1) (3) සහ මුදල් රෙගුලාසි 104 (1) (4)		2024 ඔක්තොබර් 04 වන දින අනතුරකට ලක්වූ වැන් රථය සම්බන්ධයෙන් සිදු	වැන් රථයේ අනතුර සම්බන්ධව මු.රෙ. 104 (3) අනුව විමර්ශනයක් සිදුකිරීම සඳහා	මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කල යුතුය.

කරන ලද ප්‍රාරම්භක වාර්තාව 2025 අප්‍රේල් 10 දින දක්වාම විගණනය වෙත ඉදිරිපත් නොවූ අතර අමාත්‍යාංශය සතු මෝටර් රථ 02 ක් සම්බන්ධයෙන් පූර්ණ වාර්තාවන් ලබා දීම පිළිවෙලින් මාස 2 ක් හා වර්ෂ 2 මාස 10 ක් ප්‍රමාද වී තිබුණි.	කමිටුවක් පත්කර ඇති අතර අදාළ වාර්තාව මෙතෙක් ලබාදී නොමැත. එක් මෝටර් රථයක සිදුවූ අනතුර පිළිබඳව විමර්ශන කමිටුවේ නිලධාරීන්ගේ රාජකාරි බහුලත්වය නිසා පූර්ණ වාර්තාව ලබාදීම ප්‍රමාදවී ඇති අතර අනෙක් රථයේ අලුත්වැඩියාවට අදාල ඇස්තමේන්තුව 2021.12.06 දින රක්ෂණ සමාගම වෙත ඉදිරිපත් කර තිබුණද ගෙවීම් කරනු ලබන මුදල 2023.07.25 දින දන්වා තිබූ බැවින් විමර්ශන වාර්තාව ලබාදීම ප්‍රමාද වී ඇත.

2.3 තැන්පත් ශේෂයන්

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2024 සැප්තැම්බර් 10 දිනැති අංක අමප/24/1711/622/012 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් ඉදිකිරීම් කර්මාන්තය සඳහා භාවිතා කරන ඛණිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළඳාම පිළිබඳ කාර්යය සංග්‍රහයේ පරිච්ඡේද අංක 06 හි සඳහන් ඒකීය ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක කිරීම 2024 අගෝස්තු 31 දින සිට වසර 2 ක කාලපරිච්ඡේදයක් සඳහා තාවකාලිකව අත්හිටුවා තිබුණු අතර එම අමාත්‍ය මණ්ඩල තීරණයෙහි 3.2 අනුව එකී ගාස්තු ක්‍රමය ක්‍රියාත්මක වූ කාලය තුළ මුදල් අයකර ගැනීමේ ගැටළු නිවැරදි කිරීම, දෝෂ තත්ත්වයන් සම්බන්ධයෙන් හැකි ඉක්මනින් කටයුතු කිරීම අපේක්ෂා කර තිබුණි. එහෙත් පරිසර අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුමෙහි 2023 දෙසැම්බර් 30 හා 2024 සැප්තැම්බර් 24 දිනයන්හි තැන්පත් කර තිබුණු රු.5,452,224 ක ශේෂයක් 2025 මාර්තු 31 දිනවන විටත් නිරවුල් කර නොතිබුණි. තවද ඒකීය ගාස්තු ක්‍රමය යටතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුවෙන් 2024 වර්ෂයට අදාල ගාස්තු ලෙස ලැබී තිබූ රු.1,365,923 ක මුදල භූ විද්‍යා හා පතල් කාර්යාංශය වෙත ලබා දීම සඳහා අමාත්‍යාංශ පොදු තැන්පත් ගිණුමේ තැන්පත් කර තිබුණද එම මුදලද 2025 මාර්තු 31 දිනවන විටත් නිරවුල් කර නොතිබුණි.	ඒකීය ගාස්තු ක්‍රමය යටතේ ඉදිකිරීම් කර්මාන්තය සඳහා භාවිතා කරන ඛණිජ කැණීම්, ප්‍රවාහනය සහ වෙළඳාම සඳහා වන ගාස්තු අදාල ආයතන හෝ පුද්ගලයින් මගින් සෘජුවම පරිසර අමාත්‍යාංශයට අයත් බැංකු ගිණුමෙහි තැන්පත් කරනු ලබයි. භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය මගින් එම ගාස්තු බෙදා හැරිය යුතු ආයතන ඉදිරිපත් කරනු ලබන ලේඛණ සහ අදාල කුවිතාන්සි පත් පරීක්ෂා කර, පරිසර අමාත්‍යාංශය වෙත දැන්විය යුතු අතර ඒ අනුව ගෙවීම් කටයුතු සිදු කරනු ලබයි. එහිදී උද්ගත වී ඇති යම් යම් ගැටළු නිසා ගෙවීම් කටයුතු සිදු කිරීමට නොහැකි වී ඇති බැවින් ඉදිරියේදී මෙම ගැටළු නිරාකරණය කර අදාල ආයතන වෙත ගෙවීම් සිදු කිරීමට කටයුතු කරනු ලැබේ.	උද්ගත වී ඇති ගැටළු නිරාකරණය කර අදාල ආයතන වෙත ගෙවීම් සිදු කිරීමට කටයුතු කළ යුතුය.

3. මෙහෙයුම් සමාලෝචනය

3.1 විදේශ ආධාර ව්‍යාපෘති

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
දේශගුණ විපර්යාස අවම කිරීමේ ක්‍රියාකාරී සහයෝගීතා ව්‍යාපෘතිය මඟින් සංවර්ධනය කර ක්‍රියාත්මක කිරිමට යෝජනා වූ ජාතික දේශගුණ විපර්යාස සඳහා වූ දත්ත හුවමාරු ජාලකරණ පද්ධතිය (NCC-DSN)) ස්ථාපිත කිරීම සඳහා සහ උපකරණ මිලදී ගැනීම සඳහා රු 46,371,500 ක් වැයකර තිබුණද, 2025 මාර්තු 31 දිනවන විටත් මෙම පද්ධතිය අපේක්ෂිත අරමුණු ඉටුකර ගත හැකි පරිදි ක්‍රියාත්මක තත්ත්වයේ නොමැති බව නිරීක්ෂණය විය. මේ පිළිබඳව පසුගිය විගණන වාර්තා මඟින්ද පෙන්වා දී තිබූ අතරම 2021 නොවැම්බර් 19 දින පැවති රජයේ ගිණුම් පිළිබඳ කාරක සභාවේදී මෙම ව්‍යාපෘතියේ ප්‍රගතිය සතුටුදායක මට්ටමක නොපවතින බව සඳහන් කර තිබුණු අතර අදාල අංශ සමඟ මනා සම්බන්ධීකරණයක් ඇතිකර ගනිමින් දත්ත පද්ධතිය යාවත්කාලීන කිරීමේ ක්‍රමවේදයක් පැවතිය යුතු බව හා මෙම පද්ධතිය දිගින් දිගටම පසුවිපරම් කිරීමේ අවශ්‍යතාවයද අවධාරණය කර තිබුණි.	පරිසර අමාත්‍යාංශය විසින් වෙබ් පාදක ජාතික දේශගුණික විපර්යාස දත්ත හුවමාරු ජාලය සංවර්ධනය කර දියත් කර ඒ සඳහා සහායවීමට තෝරාගත් ආයතනවලට ඩෙස්ක්ටොප් පරිගණක ලබා දුන් අතර, ඉහත කාර්යයන් ඉටුකිරීමේදී අලුතින් පිහිටුවන ලද තාක්ෂණික අභියෝග සහ සීමිත ධාරිතාව ගොඩනැගීමේ අභියෝගයන්ට මුහුණ දුන් අතර, එහි ප්‍රතිඵලයක් ලෙස NCC-DSN තාවකාලික අක්‍රියතාවය ඇති විය. ඒ සඳහා දෙවන NDA Readiness ව්‍යාපෘතියේ මූල්‍ය දායකත්වය මත තෝරාගත් සේවා සපයන ආයතනයක් විසින් පාර්ශවකාර ආයතන සඳහා වැඩමුළු මාලාව සහ පද්ධති තක්සේරුව 2024 දෙසැම්බර් 25 වන දින වන විට සාර්ථකව නිම කරන ලදී. එසේම පාර්ශ්වකාර ආයතනයන්ගෙන් ලබා ගැනීමට නියමිත දත්ත පිළිබඳව නැවත සමීක්ෂණයක් සිදු කළ අතර, දත්ත ලබාදීමට අපහසු ආයතන හඳුනාගෙන එම දත්ත පිළිබඳව සාකච්ඡාවන් එම වැඩමුළු මාලාව අතරතුර සිදු කරන ලදී.	දත්ත පද්ධතිය ස්ථාපිත කිරීම සඳහා තෝරාගත් සමාගම සමග එළඹි ගිවිසුමේ කොන්දේසි අනුව අපේක්ෂිත අරමුණු ඉටු කර ගැනීමට කටයුතු කළ යුතු අතර මෙම ව්‍යාපෘතිය සම්බන්ධයෙන් රජයේ ගිණුම්කාරක සභාවේ නිර්දේශ පරිදි කටයුතු කල යුතුය.

3.2 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

	විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ)	අමාත්‍යාංශයට අදාළව වාහන අපහරණය කිරිමේ කමිටුව මඟින් 2020 දෙසැම්බර් මස වාහනය අපහරණය කිරිම සඳහා නිර්දේශ ඉදිරිපත් කර තිබුණු අතර කමිටු තීරණයට වර්ෂ දෙකක් ගත වූ පසු 2022 නොවැම්බර් 03 දින රු.2,250,000 කට මෙම වාහනය අපහරණය කිරීම සඳහා ඉල්ලුම් කර තිබුණි. 2023 මාර්තු 09 දින කොම්ප්ට්‍රෝලර් ජනරාල් විසින් එම වාහනය අපහරණය කිරීමට අනුමැතිය ලබා දී තිබුණ ද 2025 මාර්තු 31 දිනය දක්වාම වාහනය අපහරණය කර නොතිබුණි.	මෙම අමාත්‍යාංශයට අදාළව වාහන අපහරණය කිරිමේ කමිටුව මඟින් 2020 දෙසැම්බර් මස ලබා දී තිබූ වාර්තාව අනුව අදාළ වාහනය iii වන කාණ්ඩය යටතේ වර්ගීකරණය කර ඇත. ඒ අනුව මෙම රථය අපහරණය කිරිම සඳහා අවශය ටෙන්ඩර් ලිපි ලේඛණ සකස් කර ප්‍රසම්පාදන කමිටුව වෙත භාරදී ඇත.	අපහරණ කමිටු තීරණයන් නිසි ලෙස ක්‍රියාත්මක නොකිරීම පිළිබඳව පරීක්ෂා කර නිසි ක්‍රියා මාර්ග ලබාගත යුතුය.
(ආ)	මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුව මඟින් ලබාගත් තොරතුරු අනුව පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචිකර තිබුණු වාහන සංඛ්‍යාව 251 ක් වූ අතර ඊට අමතරව අමාත්‍යාංශය විසින් භාවිතා කරනු ලබන වාහන 06ක් සඳහා අමාත්‍යාංශය නමින් පවතින ලියාපදිංචි කිරීමේ සහතික විගණනය වෙත ඉදිරිපත් කරන ලදී. එම සියළු දත්ත අනුව පරිසර අමාත්‍යාංශය නමින් ලියාපදිංචි වී ඇති මුළු වාහන සංඛ්‍යාව 257 ක් වුවත් විගණනයට ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර ඇති භෞතිකව පැවති වාහන සංඛ්‍යාව 55ක් විය. මෙම වාහන 55 තුල ඇතුලත් වාහන 03ක් වෙනත් ආයතන විසින් භාවිතා කරන බවද නිරීක්ෂණය විය. ඉතිරි වාහන 202 එවකට රේඛීය අමාත්‍යාංශය යටතේ පැවති අනෙකුත් ආයතන වෙත පැවරීම් කල බවට හෝ අපහරණය	ඇතැම් වාහන අමාත්‍යාංශය නමින් ලියාපදිංචි කර තිබුණද අමාත්‍යාංශ විෂය පථය වෙනස්වන විට එම වාහන වෙනස් වන අමාත්‍යාංශ වෙත අනුයුක්ත කර ගන්නා බැවින් එම වාහන අප අමාත්‍යාංශ වාහන ලැයිස්තුවේ සඳහන් කර නොමැත. අමාත්‍යාංශයේ මේ වන විට තිබෙනුයේ වාහන 57 ක් පමණි. ඉදිරියේදී අනෙකුත් අමාත්‍යාංශ වෙතින් විස්තර ලබාගෙන එම වාහන අදාළ අමාත්‍යාංශ වෙත පවරාදීමට කටයුතු කරනු ලැබේ.	පවතින මෙම තත්වය කඩිනමින් නිරවුල් කර ගැනීමට කටයුතු කල යුතුය.

කල බවට හෝ අතුරුදහන් වූ බවට තොරතුරු විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

3.3 අනාර්ථික ගනුදෙනු

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
2013 වර්ෂයේදී අනතුරකට ලක්ව තිබූ ජීප් රථයක් 2023 වර්ෂයේදී වත්කම් කළමනාකරණ චක්‍රලේඛ අංක 05/2020 උපදෙස් අනුව විවෘත මිල ගණන් කැඳවීම මඟින් හෝ ප්‍රසිද්ධ වෙන්දේසියේ විකිණීමේ ක්‍රම අනුගමනය නොකර රු.1,800,000 කට අපහරණය කර තිබූ අතර අපහරණය මඟින් ලද මුදලින් රු.1,614,105 ක් භාවිතා කරමින් අළුත් වැඩියා කිරීමේ වියදම පියවා ඉතිරි මුදල වූ රු.185,895 ක් මහා භාණ්ඩාගාරය වෙත ප්‍රේෂණය කර තිබුණි. මෙම ජීප් රථය සඳහා පූර්ණ රක්ෂණ ආවරණයක් ලබාගෙන නොතිබීම හේතුවෙන් ජීප් රථය අපහරණය කල මුදලින් රු.1,614,105 ක් වැය කර අනතුර මඟින් සිදු වූ අලාභය පියවීමට සිදු වී තිබුණි.	අදාළ ජීප් රථය සම්බන්ධයෙන් විමර්ශනයක් සිදුකරමින් පවතී.	අනතුරට අදාල අලාභය සම්බන්ධයෙන් වගකිව යුතු පාර්ශව හඳුනාගෙන එම අලාභ අයකර ගැනීමට කටයුතු කල යුතුය.

3.4 කළමනාකරණ දූර්වලතා

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) i. 2019 දෙසැම්බර් 27 දින අමාත්‍යාංශ ලේකම් හා අදාල ආයතනයේ අතිරේක සාමාන්‍යාධිකාරී අතර 2018 අගෝස්තු 21 දින සිට 2023 අගෝස්තු 20 දින දක්වා කාලපරිච්ඡේදය වෙනුවෙන් සොබාදම් පියස ගොඩනැඟිල්ලේ නඩත්තු කටයුතු සඳහා රු.43,156,152 ක ඇස්තමේන්තු පිරිවැයකට ගිවිසුමකට එළඹ තිබුණු නමුත් එම කාර්යය සඳහා	2018 – 2023 දක්වා ප්‍රසම්පාදන අනුමැතිය, නඩත්තු හා සේවා ගිවිසුම අත්සන් කිරීම සඳහා හා ගෙවීම් කිරීමට අදාළ ප්‍රසම්පාදන කමිටු අනුමැතියන් මේ සමඟ ඉදිරිපත් කරමි. 2022.08.21 දින සිට 2023.08.20 දිනට පැවති මිල ගණන් යටතේම ගොඩනැගිල්ලේ නඩත්තු හා සේවා කටයුතු 2023.08.21 දින සිට 2023.12.31 දින තෙක් පැවති ගිවිසුම දීර්ඝ කිරීමට හා ඒ අනුව	නඩත්තු කටයුතු සිදු කිරීම් අදාල ආයතනය වෙත පැවරීම සඳහා පූර්ව අනුමැතියක් විධිමත්ව ලබා ගත යුතුය.

විධිමත් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.	ගෙවීම් කිරීමට ප්‍රසම්පාදන අනුමැතිය ලබා දෙන ලදී.	
ii. විගණනය වෙත ඉදිරිපත් කරන ලද තොරතුරු අනුව 2021 වර්ෂයේ සිට 2023 වර්ෂය දක්වා කාලපරිච්ඡේදය සඳහා එම කාර්යය ඉටු කිරීම වෙනුවෙන් ගෙවා තිබුණු මුළු සේවා ගාස්තු වටිනාකම රු.27,600,848 ක් හා 2024 වර්ෂය වෙනුවෙන් ගෙවන ලද සේවා ගාස්තුව රු.11,053,864 ක් විය. ඒ අනුව පසුගිය වර්ෂ 04 සඳහා සොබාදම් පියස ගොඩනැගිල්ලේ නඩත්තු කටයුතු වෙනුවෙන් වැය කරන ලද මුළු වටිනාකම රු.38,654,312 ක් වී තිබුණි.	2024.05.07 දින සිට 2024.12.31 දින දක්වා ප්‍රසම්පාදන අනුමැතියට යටත්ව නව ගිවිසුමක් මඟින් ගොඩනැගිල්ලේ නඩත්තු හා සේවා කටයුතු සිදු කර ඇත. ඒ අනුව මෙම ගොඩනැගිල්ලේ සේවා හා නඩත්තු කටයුතු මෙම අනුමැතිය යටතේ සිදු කර ඇත.	නඩත්තු කටයුතු සිදු කිරීම් අදාල ආයතනය වෙත පැවරීම සඳහා පූර්ව අනුමැතියක් විධිමත්ව ලබා ගත යුතුය.

4. මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

විගණන නිරීක්ෂණය	ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම	නිර්දේශය
(අ) 2024 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ මට්ටමේ අනුමත තනතුරු 65කින් පුරප්පාඩු 15 ක් හා ප්‍රාථමික මට්ටමේ අනුමත තනතුරු 59කින් පුරප්පාඩු 12 ක් පවතින බව නිරීක්ෂණය විය.	විධායක මට්ටමට අයත් ශ්‍රී ලංකා පරිපාලන සේවයේ ,විද්‍යාත්මක සේවයේ තනතුරු සඳහා බඳවා ගැනීම් සිදු කරනු ලබන්නේ රාජ්‍ය පරිපාලන ,ස්වදේශ කටයුතු පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශය බැවින් එකී පුරප්පාඩු පිරවීම සඳහා රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය **MISCO** දත්ත පද්ධතිය හරහා හා ලිඛිතව වරින් වර දැනුවත් කිරීම් කර ඇත. ශ්‍රී ලංකා කෘෂිකර්ම සේවයේ තනතුරු අනුමත කර දෙන ලෙස මෙම අමාත්‍යාංශය විසින් ඉල්ලා නොමැත. අනුමත කර ඇති මෙම කෘෂිකර්ම සේවයේ තනතුරු හා ශ්‍රී ලංකා ඉංජිනේරු **I** ශ්‍රේණියට අනුමත කර ඇති තනතුර පරිසර අමාත්‍යාංශයේ පෙර කාර්ය මණ්ඩලයේ නොතිබූ බැවින්ද එම තනතුරුවල අවශ්‍යතාවයක් දැනට පැන නොනඟින බැවින්ද එම අනුමැතිය සංශෝධනය කර දෙන ලෙස ඉල්ලා ඇත.	කළමනාකරණ කටයුතු විධිමත්ව හා කාර්යක්ෂමව සිදු කර ගැනීමට අවශ්‍ය පියවර ගත යුතුය.